**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු 1.6.2 හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** | | |
| | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එය දින 07 ක ප්‍රමාදයකින් පසු 2024 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ)** | **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය** | | |
| | 2023 නොවැම්බර් 07 දිනැති අංක 03/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය අංක 30301 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2024 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එය දින 19ක ප්‍රමාදයකින් පසුව 2024 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පූර්ව වර්ෂයට අදාළ අගයන් නිරූපනය කිරීමේදී සංශෝධිත අගයන් දක්වා නොතිබුණි. | 2022 වර්ෂයට අදාල මුදල් ප්‍රවාහ, නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදි කරන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අගයන් නිවැරදිව නිරූපනය කළ යුතුය. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු.1,200,000 ක් දක්වා නොතිබුණ අතර භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.1,200,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය නිවැරදි කරන බව | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම හා අත්තිකාරම් අයකර ගැනීම් පිළිවෙලින් රු.1,715,831 ක් හා රු.1,149,760 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.2,865,591 කින් අධි ගණනය වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

(ආ) **පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහනාධාර සහ මාරු කිරීම් රු.2,865,591 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

(ඇ) **මූල්‍ය නොවන වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බලවේග පෙහෙකම්හල් 3 ක් ඒවා පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා තිබුණද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් එම ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම ඉවත් කර නොතිබුණි. | මෙම වත්කම්වල වටිනාකම ඉවත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කළ බව. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය නිවැරදිව දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | යටිනුවර බලවේග පේෂකර්මාන්ත ශාලාවෙන් 2000 – 2012 කාලය සඳහා ලැබිය යුතු හිඟ බදු මුදලින් රු.556,000 ක් තවදුරටත් අයවීමට පැවතුණි. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශයේ අනුමැතිය පරිදි 2023 නොවැම්බර් 09 දිනට හිඟ මුදල වන රු.2,156,000 ක මුදල එදින සිට වාරික 12 කින් අයකර ගැනීමට අවසර ලබා දී ඇති අතර 2024 අප්‍රේල් .30 දිනය වන විට රු.1,600,000 ක මුදලක් අය කර ගෙන ඇති බව. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) තලල්ල හා හිඟුරක්ගොඩ බලවේග පේෂකර්මාන්ත ඉඩම හා ගොඩනැගිලි බදු පදනමට ලබාදීමට අදාළව පිළිවෙලින් 1995 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා සහ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු. 9,431,000 ක් අයකරගෙන නොතිබුණි. | තලල්ල බලවේග පේෂ කර්මාන්ත ඉඩමට අදාල හිඟ බදු මුදල අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළව අවසන් විමසීම් ලිපිය 2024 පෙබරවාරි 22 දින යොමු කළ බව.<br><br>හිඟුරක්ගොඩ බලවේග පේෂ කර්මාන්ත ඉඩම හා ගොඩනැගිලි මත වූ හිඟ බදු මුදල අය කර ගැනීමට අදාළව පැවරූ නඩුව ඉල්ලා අස්කරගෙන ඇති අතර හිඟ බදු මුදල 2023 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවා අවසන් කරන මෙන් බදු කරු වෙත 2023 දෙසැම්බර් 09 දින නැවත දැනුම් දුන් බව. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) බිබිල බලවේග පේෂකර්මාන්ත ඉඩම හා ගොඩනැඟිලි බදු පදනම මත ලබාදීමට අදාළව අයවිය යුතු රු.1,681,250 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට අදාළව බස්නාහිර පළාත් මහාධිකරණයේ නඩු පැවරූ බව. | හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සය මාසික පාඨමාලාව සඳහා කටුබැද්ද පුහුණු ආයතනයට පමණක් සිසුන් දෙදෙනෙකු ලියාපදිංචි වී තිබූ අතර සිසුන් ලියාපදිංචි වී නොතිබීම නිසා අනෙක් පුහුණු ආයතන 13 හි ම එම පාඨමාලාව පැවැත්වීමට නොහැකිවී තිබුණි. | දෙපාර්තමේන්තුව සතු පුහුණු ආයතනවල භෞතික ඉඩ ප්‍රමාණය අනුව එක් ආයතනයක සිසුන් උපරිම වශයෙන් 15 දෙනෙකු පමණ පුහුණු කල හැකි වුවද, පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ ඉල්ලුම ක්‍රමිකව අඩු වීම සිදු ව ඇති බව. | වැඩි සිසුන් ගණනක් බඳවා ගැනීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ආ) අවසාන සහතික පත්‍ර පාඨමාලා සඳහා කටුබැද්ද පුහුණු ආයතනයට සිසුන් 19 දෙදෙනෙකු ද, අනෙක් පුහුණු ආයතන 13 සඳහා සිසුන් 5 ක සිට 9 ක් අතර සංඛ්‍යාවක් වශයෙන් එකතුව සිසුන් 91 දෙදෙනෙකු ලියාපදිංචි වී තිබුණි. | | |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පේෂකර්මාන්ත පුහුණු ආයතන 11 ක් සහ සංචාරක නිවාස 02 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීම සිදු කර නොතිබුණි. | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව සතු පුහුණු ආයතන 03 ක ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන ඇති අතර, සෙසු පුහුණු ආයතනයන්හි ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අයිතිය නිශ්චිතව හඳුනාගෙන නොමැති, මුරකුටියක් හා ගොඩනැගිලි 02 කින් සමන්විත පර්චස් 30 ක ඉඩමක් වූ රාජගිරියේ ස්වාභාවික වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානය වසර 3 කට වැඩි කාලයක සිට උපයෝජනය නොවී පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි නීත්‍යානුකූල පැවරීමකින් පරිහරණය කරන ලද මෙම ගොඩනැගිල්ල ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් බව තහවුරු වී ඇති බැවින් පවරා ගැනීම් කටයුතු සිදු කරන ලෙස දැනුම් දුන් බව. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.19,991,000 ක් වටිනා අත්යන්ත්‍ර කට්ටල 185ක් සහ වයින්ඩින් යන්ත්‍ර 146 ක් වසර 3 ක් තිස්සේ කටුබැද්ද ගබඩා පරිශ්‍රයේ නිශ්කාර්යව පැවතුණි. | 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද පේෂ කර්මාන්ත ගම්මාන වැඩසටහන් සඳහා මිලදීගත් වටිනාකම රු.19,991,000.00 ක් වූ මෙම යන්ත්‍ර තොගය, සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ට නිකුත් කිරීමට පියවර ගනිමින් ඇති බව. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු ආරම්භ කර කටයුතු කෙරෙමින් පවතියි. | දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතුය. |